සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 6 - 2019

නම : ............................................... විද්‍යාව කාලය : පැය 02 යි.

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- සෑම පිළිතුරකට ම ලකුණු 1 බැගින් හිමි වේ.
- 1 - 25 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) සියලු ම සතුන්ගේ ලක්ෂණයකි.

1. සීමා රහිත වර්ධනය. 2. ස්වයං පෝෂී වීම.
3. හරිතප්‍රද රහිත වීම. 4. සංචරණය කළ හැකි වීම.

(02) ශාකවලට පමණක් කළ හැකි කාර්යය වන්නේ,

1. ඔක්සිජන් ලබාගෙන කාබන්ඩයොක් සයිඩ් පිටකිරීමයි.
2. කාබන්ඩයොක්සයිඩ් ලබාගෙන ඔක්සිජන් පිට කිරීමයි.
3. ඔක්සිජන් යොදා ගෙන ආහාර නිෂ්පාදනය කිරීමයි.
4. ආහාර වැය කරමින් ඔක්සිජන් නිපදවීමයි.

(03) පරිසරයෙහි ඉඩක් ගන්නා දෙය තෝරන්න.

1. වාතය 2. ආලෝකය 3. තාපය 4. ශබ්දය

(04) පහත රූපයේ A, B, C පිළිවෙළින්




1. මතු පිට ජලය, භූගත ජලය, වර්ෂණය. 2. වර්ෂණය, භූගත ජලය, මතු පිට ජලය.
3. වර්ෂණය, මතු පිට ජලය, භූගත ජලය. 4. භූගත ජලය, වර්ෂණය, මතුපිට ජලයය.

(05) ලවණතාවය අනුව අඩු ම ලවණ ප්‍රමාණයක් අඩංගු වන්නේ,

1. මඩ දියෙහි ය. 2. කරදියෙහි ය. 3. මිරිදියෙහි ය. 4. කිවුල් දියෙහි ය.

(06) ස්වාභාවික ශබ්දයක් නොවන්නේ,

1. කුරුළු හඬයි 2. දිය ඇල්ලක හඬයි. 3. නළා හඬයි. 4. සුළඟේ හඬයි.



LIVEWORKSHEETS

(07) කඳු මුදුනක වෙසෙන අයෙකුට පහසුවෙන්ම යොදාගත හැකි ශක්ති ප්‍රභවය.

1. සුළඟයි    2. ගලා යන ජලයයි.    3. උදම් ශක්තියයි.    4. ෆොසිල ඉන්ධනයි

(08) වායු අවස්ථාවේ පවතින පොසිල ඉන්ධන වර්ගය තෝරන්න.

1. LP වායුව    2. පෙට්‍රල්    3. ගල් අඟුරු    4. ජීව වායුව

(09) පෙනීම ආදර්ශනය කිරීමට යොදාගන්නා පහත ඇටවුම මගින් තහවුරු කළහැක්කේ,




1. පෙනීමට ඇස අවශ්‍ය බවයි
2. පෙනීමට ආලෝකය අවශ්‍ය බවයි.
3. පෙනීමට වස්තුවක් අවශ්‍ය බවයි.
4. පෙනීමට සිදුරක් අවශ්‍ය බවයි.

(10) අදීප්ත වස්තුව තෝරන්න.

1. සූර්යයා    2. චන්ද්‍රයා
3. දැල් වූ ඉටි පන්දම    4. විදුලි බුබුල

(11) පහත රූපයේ දැක්වෙන්නේ පෘථිවියෙහි ජලය පවතින ආකාර දැක්වීමට අඳින ලද වෘත්ත ප්‍රස්තාරයකි. ඒ අනුව සාගර වල පවතින ජලය සහ පරිභෝජනයට ගත හැකි ජල ප්‍රමාණ පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක්ද?




1. A හා B ය.    2. B හා C ය.
3. A හා C ය.    4. B හා B ය.

(12) උෂ්ණත්වය මැනීම සඳහා යොදා ගන්නා අන්තර් ජාතික සම්මත ඒකකය වන්නේ,

1. කෙල්වින් ය.    2. සෙන්ටිග්‍රේඩ් ය.
3. ෆැරන්හයිඩ් ය.    4. සෙල්සියස් ය.

(13) ශාක ප්‍රභාසංස්ලේෂණය සඳහා පසෙන් ලබාගන්නා සාධකය,

1. සූර්ය ශක්තියයි.    2. කාබන්ඩයොක්සයිඩ් වායුවයි.
3. ජලයයි.    4. හරිතප්‍රදයි.

(14) නිවැරදි ප්‍රකාශය තෝරන්න. .

1. අධික ශබ්දය කණට හානි කර නොවේ.
2. සර්පිනාව තත් කම්පනයෙන් හඬ නිපදවයි.
3. සවන් ආරක්ෂක පළඳින්නේ, සතුන්ගෙන් ආරක්ෂා වීමටය.
4. ධ්වනිය ඇති වන්නේ කම්පන මගිනි.

(15) පහත ඒවා අතරින් චුම්බකයක් මගින් වෙන් කර ගත හැකි ද්‍රව්‍ය කුමක් ද?

1. පිත්තල කුඩු    2. ඇලුමිනියම් කුඩු
3. වානේ කුඩු    4. තඹ කුඩු



LIVEWORKSHEETS

(16) නිදහසේ චලනය විය හැකි චුම්බකයක හැසිරීම ඇසුරින් නිපදවා ඇති උපකරණය

1. උණ කටුවයි. 2. පීඩන මානයයි. 3. මාලිමාවයි. 4. සුළං දිශා දර්ශකයයි.

(17) රසායනික කෝෂ වර්ගය සහ ඊට උදාහරණය දැක්වෙන පිළිතුර තෝරන්න.

| | **රසායනික කෝෂ වර්ගය** | **උදාහරණය** |
|---|---|---|
| 1. | ප්‍රාථමික කෝෂ | වියළි කෝෂය |
| 2. | ප්‍රාථමික කෝෂ | ජංගම දුරකථන බැටරිය |
| 3. | ද්විතීයික කෝෂ | සූර්ය කෝෂ |
| 4. | ද්විතීයික කෝෂ | ඔරලෝසු බැටරිය |

(18) පහත විදුලි පරිපථයේ A, B, C අනුපිළිවෙළින්




1. ඇමීටරය, බල්බය, වියළි කෝෂය
2. බල්බය, ඇමීටරය, වියළි කෝෂය
3. වියළි කෝෂය, බල්බය, ඇමීටරය
4. බල්බය, වියළි කෝෂය, ඇමීටරය

(19) පහත රූපයේ දැක්වෙන්නේ සිහින් කම්බි දඟරයක් තුළින් විදුලි යැවූ අවස්ථාවකි. ඉන් ලැබිය හැකි නිරීක්ෂණය විය හැක්කේ,




1. කම්බිය දිය වී යාමයි.
2. කම්බිය රත් වීමයි.
3. කම්බියෙන් ආලෝකය විහිදීමයි.
4. දඟරය දිගින් වැඩිවීමයි.

(20) ඇතිල්ලීමෙන් තාපය නිපදවා ප්‍රයෝජනයට ගන්නා අවස්ථාව තෝරන්න.

1. රබර් කැබැල්ලකින් අකුරු මැකීම. 2. ගිණිකූරක් දැල්වීම.
3. බුරුසුවකින් තීන්ත ගෑම. 4. රෙදි මැදීම.

(21) පරිසරයට එකතු වන තාප ප්‍රමාණය වැඩි වීම නිසා සිදු විය හැක්කේ,

1. හිම කඳු දියවීමයි. 2. ගංවතුර ඇතිවීමයි. 3. නාය යාමයි. 4. තද වැසි ඇති වීමයි.

(22) ප්‍රසාරණය පිළිබඳ දැනුම භාවිතයට යොදා ගත **නොහැක්කේ,**

1. හිර වූ බෝතල් මූඩියක් ගැලවීමේ දී 2. කරත්ත රෝදවලට පට්ටම් යෙදීමේ දී
3. රේල් පීලි සවි කිරීමේ දී 4. යකඩ ගේට්ටු සැකසීමේ දී

(23) ලොව සියලු ම සතුන් සඳහා ආහාර නිෂ්පාදනය කරන්නේ,

1. ශාක විසිනි. 2. කුඩා සතුන් විසිනි.
3. යුෂ උරා බොන්නන් විසිනි. 4. මිනිසා විසිනි.

(24) නිවැරදි පිළිතුරු තෝරන්න.

1. ආහාර ජාල එක් වී ආහාර දාම ඇති වේ.
2. ආහාර දාමයක දෙවන පුරුක හැම විට ම මාංශ භක්ෂක ය.
3. ආහාර දාම ඔස්සේ සූර්ය ශක්තිය ගලා යයි.
4. ආහාර දාමයක නිෂ්පාදකයා අනිවාර්යයෙන් ම මාංශ භක්ෂකයෙකි.

(25) අනිල මානයක් වට 20ක් කරකැවීමට ගත වූ කාලය මිනිත්තු 4කි. එහි වේගය,

1. මිනිත්තුවට වට 20/4 කි. 2. මිනිත්තුවට වට 20 x 4 කි.
3. මිනිත්තුවට වට 20/2 කි. 4. මිනිත්තුවට වට 2/20 කි.



LIVEWORKSHEETS